# මහාබෝධිය මුල් බැසගැනීම

## (ශ්‍රී මහාබෝධිශාඛාව වෙන් කර ගැනීම, මුල් අද්දවාගැනීම හා රෝපණය සම්බන්ධයෙන් වන වංසකථාගත ප්‍රවාද පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්)

"***.....මහා බෝධි ශාඛා තොමෝ රේඛා කළ තැනින් තොමෝම සිඳී සුගන්ධකර්මයෙන් පිරුණු වූ කටාරම මත්තෙහි පිහිටියේ ය. නරේශ්වර තෙම මූල රේඛාවෙන් මත්තෙහි තුනඟුලෙන් තුනඟුල රත් සිරියලෙන් නව තැනෙක රේඛා දනය කරමින් පිරිසින්දේ ය. ආදී වූ රේඛාවෙන් මහත් වූ මුල් ද අනිකුත් රේඛාවලින් කුඩා මුල් ද දසය දසය නික්ම ගෙන දල් කවුළු සාමාන ව පාත බැස්සාහු ය ...***"( මහාවංශය පරි.xviii, 42-45 ගාථා )

### ප්‍රවේශය

ශ්‍රී ලාංකේය පැරණි වංසකථා හා සම්භාව්‍ය සාහිත්‍ය කෘතීන්ගෙන් ඉතිහාස අධ්‍යයනය විෂයයෙහි මූලාශ්‍රයමය වශයෙන් සැලසෙන මෙහෙය අනල්ප ය. එහෙත් ඒවායෙන් ඓතිහාසික කරුණු උකහා ගැනීමේ දී අතිශෝක්තීන් හා අභව්‍ය සිදුවීම් අන්තර්ගතවීම, රචිත වකවානුව හා අදාළ සිදුවීම අතර පවතින කාල අවකාශීය දූරස්ථබව, සැපයෙන තොරතුරුවල ගුණාත්මකබව හා ප්‍රමාණාත්මකබව පිළිබඳ ගැටලු වැනි කාරණා සම්බන්ධයෙන් වඩාත් විමර්ශනශීලී විය යුතු ය. පූර්ව හා මුල් ඓතිහාසික යුගයන්ට අදාළ ව සැලකීමේ දී එකී අවශ්‍යතාව දැඩි ව අවධාරණය වන්නේ ඉතා පැරණි මෙන් ම සංක්‍රාන්තිකර සංස්කෘතික අවධි කිහිපයක් ඊට අයත්වන බැවිනි. මෙහි දී විශේෂ අවධානයට ලක් කෙරෙන මහාබෝධිය මුල් බැසගැනීම හා මුල් බැසගැනීම ද යථෝක්ත කාල අවකාශයට අයත් එකිනෙකට ආබද්ධ සංසද්ධීන් ද්විත්වයකි. පළමු ව මහාබෝධිය 'මුල්බැසගැනීම' යන්නෙන් මහාබෝධි සංස්කෘතිය ස්ථාපිතවීම, සංවර්ධනය හා ව්‍යාප්තිය අදහස් කෙරන අතර එය බොහෝ පර්යේෂකයන්ගේ අවධානයට ලක් වූ විෂයක්ෂේත්‍රයකි. එකී පරිවර්තනයන් සමාජ - සංස්කෘතික හා දේශපාලනික අර්ථයෙන් පුළුල් ව සාකච්ඡාවට බඳුන්වූ අවස්ථා රැසක් හඳුනාගත හැකි ය. මෙහිලා දෙවනු ව මහා බෝධිය මුල්බැසගැනීම යන්නෙන් අදහස් කෙරන්නේ භෞතික වශයෙන් ශ්‍රී මහාබෝධි රෝපණය, ඒ හා බැඳි සිදුවීම් මාලාව යි. ඒ සම්බන්ධයෙන් සප්‍රමාණික වංසකථාගත තොරතුරු දක්නට ලැබුණ ද යටත් පිරිසෙයින් මූලික හෝ විද්‍යාත්මක ප්‍රවේශයකින් තොර ව ඒවායේ භව්‍යතාව පිළිබඳ අදහසකට එළඹීම දුෂ්කර වේ. එබැවින් මෙම අධ්‍යයනයේ දී මහාබෝධිය මුල් බැසගැනීම පිළිබඳ වංසකථාගත ප්‍රවාද මූලික විද්‍යාත්මක පදනමක් ද සහිත ව තුලනාත්මක ව විශ්ලේෂණය කිරීමට උත්සුක වන අතර එමගින් ඊට හිමිවිය යුතු ඓතිහාසික සංදර්භමය වැදගත්කම අවධාරණය කරගැනීමට අපේක්ෂා කෙරේ.

### මූලාශ්‍රය

යථෝක්ත සිදුවීම පිළිබඳ විස්තරාත්මක තොරතුරු අන්තර්ගත සාහිත්‍ය මූලාශ්‍රය ලෙස මහාවංසය, වංසත්ථප්පකාසිනිය, සමන්තපාසාදිකාව, මහා බෝධිවංසය, ථූපවංසය හා ජිනකාලමාලී යන කෘතීන් හඳුනාගත හැකිය. ඒ හැරුණු විට දීපවංසය, පූජාවලිය, රාජරත්නාකරය, රාජාවලිය යන ග්‍රන්ථවල ද මහාබෝධි රෝපණය වාර්තා කර ඇත. ඉහත පළමුවෙන් සඳහන් කළ මූලාශ්‍ර අතර එන මහාවංසය ක්‍රි.ව. 5 - 6 සියවස්වල රචනා වූවක් ලෙස සැලකෙන නමුදු එය ඊට පූර්වයෙන් පැවති සීහළට්ඨකථා මහාවංසයේ සංස්කරණයක් වශයෙන් සම්පාදනය වූවක් බව කිය වේ. එහි 'මහාබෝධිගහණ' නම් වූ xviiiවන හා 'බෝධි ආගමනය' නම් වූ xixවන පරිච්ඡේදයන්හි ප්‍රස්තුත

විස්තර අන්තර්ගත ව තිබේ (මහාවංශය පරි.xviii). වංසත්ථප්පකාසිනීයනු මහාවංසයට ලියවුණු ටීකාවයි. මහා බෝධි ආගමනයට අදාළ මහාවංස ප්‍රවෘත්තිය එහි තවදුරටත් විස්තර කෙරේ (වංසත්ථප්පකාසිනී 1994. 298- 309 පිටු බලන්න). සමන්තපාසාදිකාව ද මහාවංසය හා සමකාලීන ව ම සම්පාදනය වූ කෘතියකි. විනය පිටකයට ලියැවුණු අටුවාව වන මෙය බුද්ධඝෝෂ හිමියන් විසින් රචනා කළබව පිළිගැනේ. එහි, අපගේ ප්‍රස්තුතය වන අදාළ කරුණු 'බාහිරනිධානවණ්ණනා' නම් කොටසෙහි අන්තර්ගත ව තිබේ (සමන්තපාසාදිකාව 2003, 74 - 81 පිටු බලන්න). මහාබෝධිවංසයේ මෙන් ම ථූපවංසය ද මධ්‍යකාලීන යුගයේ රචනා වූ කෘතීහු වෙති. එහෙත් මහාවංසය වැනි පුරාතන යුගයේ ලියවුණු හා සංස්කරණය වුණු කෘතීන් සඳහා පාදකකොට ගැනුණු මහාබෝධිවංසයක් මුල් කාලීන ව පැවත ඇත. ඇතැම් විට එය ම අවසාන වරට කුරුණෑගල රාජධානි සමයේ සංස්කරණය වූවා වීමට ද ඉඩ තිබේ. කෙසේ නමුදු බෝධිවංසයේ 'දුමින්දගමන කථා' හා 'මහා බෝධි ප්‍රතිෂ්ඨාපන කථාව' නම් කොටස්වල මහාබෝධි රෝපණයට අදළ විස්තර අන්තර්ගත වේ (බෝධිවංශය 307 - 345 පිටු බලන්න). ථූපවංසයේ එම සිදුවීම් 'බෝධි ආගමන කථා' යන කොටසට ඇතුළත් ව තිබේ (සිංහල ථූපවංශය 210-217 පිටු බලන්න). ජිනකාලමාලී 14 - 15 සියවස්වල රචනා වූ බව උපකල්පනය කෙරෙන අතර එහි මෙම සිදුවීම් 'මහබෝධි ගමනාරම්භ' යන උද්ධෘතය යටතේ විස්තර කර ඇති ආකාරය හඳුනාගත හැකි ය( ජිනකාලමාලී 144 - 148 පිටු බලන්න ).

මහාබෝධි රෝපණය, උක්ත මූලාශ්‍රවල විස්තර වී ඇති ආකරය බොහෝ සෙයින් එකිනෙකට සමානත්වයක් දක්වයි. එහෙත් ඇතැම් තැනක සුළු සුළු වෙනස්කම් ද නැත්තේ ම නොවේ. එකී විස්තරවල පවතින කැපීපෙනෙන සාම්‍යය කෙරෙහි මෙරට පැවති ඓතිහාසික සාහිත්‍ය සම්ප්‍රදාය ඉවහල්වන්නට ඇති අතර පූර්වතමයන් විසින් සඳහන් කළ තොරතුරු ද ආශ්‍රය කොටගෙන සංස්කරණ හෝ නව සම්පාදනයන් සිදු කිරීමට පසු කාලීන පිරිස් කටයුතු කර ඇති බව පෙනේ. එමෙන් ම යටත් පිරිසෙන් මෙවැනි ආයතනිකමය වැදගත්කම් සහිත සුවිශේෂී සිදුවීම් පිළිබඳ පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය වූ ජන විඥානගත මතකයන් ද මෙම කෘතීන්ට අන්තර්ගත වූ බව සිතීමට ඉඩ තිබේ. එබැවින් ප්‍රස්තුත සිදුවීම හා එය විස්තරකෙරෙන මූලාශ්‍ර රචනා වුණු අවධිය අතර කාල අවකාශය එක් එක් මූලාශ්‍රය සම්බන්ධයෙන් විවිධත්වයක් පෙන්නුම් කළ ද, සාපේක්ෂ වශයෙන් යම් මූලාශ්‍රයක් නූතන වූ පමණින් එහි අන්තර්ගත තොරතුරුවල විශ්වාසනීයත්වය පිළිබඳ පූර්ව නිගමනයන්ට එළඹීම යෝග්‍ය නොවන බව පැහැදිලි ය.

**බෝධි ආගමනය හා බැඳි රාජ්‍යතාන්ත්‍රික කටයුත්ත**

සාහිත්‍ය මූලාශ්‍රයාගත තොරතුරු අනුව ක්‍රිස්තු පූර්ව තුන්වන සියවස පමණ වන විට භාරතය හා මෙරට අතර පැවති රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා විධිමත්, සංවිධිත ස්වරූපයකින් ක්‍රියාත්මක වූ බව පෙනීයන කරුණකි. විශේෂයෙන් ම මෞර්ය රාජ්‍ය අභිෂේක ක්‍රමය හඳුන්වාදීම, මහින්දගමනය, ධාතුන්වහන්සේලා ලබාගැනීම, මෙන් ම ශ්‍රී මහා බෝධීන් වහන්සේ මෙරටට වැඩම කරවීම යන සියලු සිදුවීම් දෙරටේ ම නියෝජිතයන් එක් ව කල්තබා සැලසුම් කරන ලද ක්‍රියාවලියක ප්‍රතිඵල බව හඳුනාගත හැකි වේ. උක්ත සියලු මූලාශ්‍රයන් විස්තර කරන පරිදි මහාබෝධි ආගමනය සම්න්ධයෙන් කටයුතු සංවිධානය වන්නේ මිහිඳු හිමියන් මෙරටට වැඩම කර මාස කිහිපයක් ඉක්මයාමත් සමගිනි. තව ද, අනුලා බිසව ඇතුළු කාන්තාවන් පිරිසක් පැවිද්ද අපේක්ෂාවෙන් ඉල්ලීම් කිරීම නිසා සංඝමිත්තා තෙරණිය මෙරටට වැඩම කරවා ගැනීමේ කාර්යය ද මේ හා සමගාමී ව

සංවිධානය වූ බව පෙනේ. මහින්දගමනය සම්බන්ධයෙන් ද ක්‍රියා කළ රාජ්‍යතාන්ත්‍රිකයාට ම මෙකී කාර්යයන්හි වගකීම් පැවරීමෙන් ද ප්‍රත්‍යක්‍ෂ වන්නේ මෙරට ඒ කෙරෙහි දැක්වූ පුළුල් අපේක්‍ෂා සහගත බවයි.

වංසකථාගත තොරතුරු අනුව මහාබෝධිය මෙරටට වැඩම කරවීම සම්බන්ධයෙන් වූ අදහස මිහිඳු හිමියන් වෙතින් ඉදිරිපත් වූවකි. මිහිඳු හිමියන් විසින් පෙර දවස තමන්ට දෙනු ලැබූ උපදෙස් අනුව දේවානම් පියතිස්ස රජු අරිට්ඨ කුමරුට මෙකී වගකීම පැවරීමට කටයුතු කර ඇති අතර ඊට මත්තෙන් ද උන්වහන්සේ සමග විශේෂ සාකච්ඡාවක නිරත විය ( මහාවංශය 1959, xviii, 2 ගාථාව; වංසත්ථප්පකාසිනී 299 ; මහා බෝධිවංශය 309 ; සමන්තපාසාදිකා විනයට්ඨ කථා 75 ). මහාබෝධිය මෙරටට වැඩම කිරීම මිහිඳු හිමියන්ගේ ධර්මප්‍රචාර වැඩපිළිවළේ ප්‍රධාන අංගයක් වූ බව පෙනී යන්නේ වංසකථාවන් වාර්තා කරන පරිදි උන්වහන්සේ මෙරටට වැඩම කර ගත වූ මුල් දින කිහිපය තුළ ප්‍රකාශ කළ අනාගත වාක්‍යන් අතර සංඝමිත්තා තෙරණිය විසින් ශ්‍රී මහා බෝධිය මෙරටට වැඩම කරවීම සිදුවන බව අන්තර්ගත වන බැවිනි ( මහාවංශය 1959, පරි. xviii, 34 ගාථාව ). තව ද, සාහිත්‍ය මූලාශ්‍රය අනුව පෙර බුදුවරුන්ගේ බෝධීන් ද විවිධ තෙරණීන් වහන්සේලා විසින් මෙරටට වැඩම කරවා තිබේ ( මහාවංශය පරි. xviii, 32- 40 ගාථා; සමන්තපාසාදිකා විනයට්ඨ කථා 77).

වැදගත් කාර්යයන් ද්විත්වයක් ඉටුකරගැනීමේ අපේක්‍ෂාවෙන් භාරතය බලාගිය අරිට්ඨ කුමරු ඇතුළු පිරිස අත තම පියරජු වෙත හසුන් යැවීමට ද මිහිඳු හිමියන් කටයුතු කළ බව මහාවංසයේ සඳහන් වන අතර (මහාවංශය පරි. xv, 34 ගාථාව) බෝධිවංසයේ කියැවෙන්නේ උන්වහන්සේ මෙන් ම දේවානම්පියතිස්ස රජු ද අශෝක රජු වෙත හසුන් යැවූ බවයි ( බෝධිවංශය 309). මෙරට දූත පිරිස පළමු ව අශෝක රජු ද දෙවනු ව සංඝමිත්තා තෙරණිය ද හමුවීමට කටයුතු කර ඇති අතර වංසකථාවන්ට අනුව භාරතයෙන් ඊට ලැබුණු ප්‍රතිචාරය සුබවාදී මෙන් ම උද්යෝගිමත් එකක් වූ බව පැහැදිලි ය ( මහාවංශය පරි. xviii, 14 -18 ගාථා බලන්න). සංඝමිත්තා තෙරණිය මෙරටට වැඩම කරවීම සම්බන්ධයෙන් වන ඉල්ලීමට ඇගේ ම අභිමතය අනුව තීරණයක් ගැනීමට අශෝක රජු විසින් අවකාශ සැලසූ බව හඳුනා ගැනීමට පුළුවන. විශේෂයෙන් ප්‍රස්තුත ප්‍රතිචාරය විෂයයෙහි සමකාලීන දේශපාලනික පසුබිම හැරුණු විට මිහිඳු හිමියන් අශෝක රජුට දැක්වූ සමීප ඥාතීත්වය මෙන් ම උන්වහන්සේ, භාරතය නියෝජනය කළ රාජ්‍ය තාන්ත්‍රිකයකු ලෙස කළ ඉල්ලීම ඉවහල් වන්නට ඇත.

## බෝධිශාඛාව වෙන් කර ගැනීම පිළිබඳ විස්තරය

වංසකථාගත තොරතුරු සියුම් ව නිරීක්‍ෂණය කිරීමේ දී ශ්‍රී මහාබෝධියේ දක්ෂිණ ශාඛාව ලබාගැනීම සම්බන්ධයෙන් සිදුකළ ඉල්ලීම පහසුවෙන් ඉටුකළ හැකි කාර්යයක් නොවූ බව රජු සම්බන්ධයෙන් ක්‍රියාකළ ආකාරයෙන් පෙන්නුම් කෙරේ. මහාවංසයේ කියවෙන පරිදි 'ශස්ත්‍ර ප්‍රහාරයට නුසුදුසු මහ බෝධි වෘක්ෂයෙන් ශාඛාව කෙසේනම් ගනී දැ' යන්නෙන් ගැටලුවකට පත්වූ බවයි ( මහාවංශය 2006, පරි. xviii, 19-20 ගාථා). බෝධිවංසයේ ද ඊට සමාන යෙදුමක් දක්නට ලැබේ ( බෝධිවංශය 310). 'ශස්ත්‍ර ප්‍රහාරයට නුසුදුසු' යන්න වංසත්ථප්පකාසිනියේ අර්ථ දක්වෙන්නේ 'සැතෙකින් නොසිඳිය යුතු' වශයෙනි ( වංසත්ථප්පකාසිනී 302 ). 'ශස්ත්‍ර' යන සංස්කෘත පදය ආයුධ යන අරුත් ගනී ( See, *A Sanskit English Dictionary* 1986, p 1060). එබැවින් එහි තේරුම නම් ආයුධයක් භාවිතයෙන් කපා වෙන් නොකළ යුතුය යන්නයි. බැලූ බැල්මට මෙම ප්‍රකාශයෙන් මහාබෝධියේ ගෞරවාර්ථය පිළිබඳ ගැටලුවක් පෙන්නුම් කළ ද, අතිසංවේදී පූජ්‍ය වස්තුවක්

සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී දේශපාලනික භූමිකාවක් නියෝජනය කළ රජුට මුහුණ දීමට සිදු වූ අභියෝගය ද එයින් ප්‍රකටවන බව සිතීමට ඉඩ තිබේ. එය සනාථ කරවන කරුණක් ලෙස, ප්‍රස්තුත කාර්යය සිදු කිරීමට මත්තෙන් මහාදේව අමාත්‍යවරයාගේ උපදෙස් අනුව මොග්ගලීපුත්ත හිමි හමුවී එහි යෝග්‍ය අයෝග්‍ය බව විමසීම දැක්විමට පුළුවන( මහාවංශය පරි.xviii, 20-22 ගාථා.).

සමාජ - දේශපාලනික වශයෙන් පමණක් නොව, තාක්‍ෂණික වශයෙන් ද මෙබඳු පූජනීය බෝධි වෘක්‍ෂයකින් ශාඛාවක් ගෙන රෝපණය කරගැනීම සමකාලීන වශයෙන් අභියෝගයක් වූ බව සිතීමට ඉඩ තිබේ. එබඳු අවදානමක් ගැනීම ශාඛාව මෙන් ම ඇතැම්විට මව් ශාඛය ද අනතුරේ හෙළීමකි. කෙසේ නමුදු වංසකථාගත තොරතුරු අනුව ශ්‍රී මහා බෝධියේ දක්‍ෂිණ ශාඛාව තොමෝ ම සිඳී වෙන්වීම බුදුන් වහන්සේගේ ප්‍රාර්ථනා පහෙන් ද එකක් වූ බැවින්( සමන්තපාසාදිකාව 77) එබඳු ම ආශ්චර්යවත් ස්වරූපයකට කඳෙන් වෙන් වීම සිදුව තිබේ ( මහාවංශය පරි. xviii, 40-41 ගාථා). එහෙත් එකී කාර්යය සිදුවීමට පෙර හා පසු ඒ හා බැඳි පැහැදිලි තාක්‍ෂණික ක්‍රියාවලියක් පැවති බව සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනයේ දී හඳුනාගත හැකි වේ.

විශේෂයෙන් ම දක්‍ෂිණශාඛාව රෝපණය කිරීමට යටත් පිරිසෙන් යම් නිශ්චිත විශාලත්වයකින් යුත් කටාරමක් කරවීමෙන් පෙනීයන්නේ මව් ශාකයෙන් වෙන් කර ගනු ලබන ශාඛාව පිළිබඳ පූර්ව අවබෝධයක් පැවති බවකි. මහාවංසයට අනුව එකී භාජනය නව රියන් විවරයකින් ද (අඩි 13 1/2) පස් රියන් උසින් ද (අඩි 7 1/2) තුන් රියන් විෂ්කම්භයකින් ද (අඩි 4 1/2) අට අඟලක ඝනකමින් ද යුක්තව තිබේ ( එම, 26-28 ගාථා ). ඇතැම්විට මෙකී අගයන් අතිශයෝක්තිගත වියහැකි නමුදු පැලයක් නොව, ශාඛාවක් රෝපණය කිරීමේ දී මීට සමාන සැලකිය යුතු විශාලත්වයකින් යුක්ත භාජනයක අවශ්‍යතාව මතු වූවා විය හැකි ය. තව ද, ශාඛාව ලබා ගැනීම සඳහා ශ්‍රී මහාබෝධිය අසලට ළඟාවීමේ දී එහි රියන් හතරකට වඩා උසින් වූ සියලු ශාඛා නොපෙනී ගිය බව කිය වේ ( එම, 34-35 ගාථා). බොහෝවිට එමගින් වෙන් කර ගැනීමට අපේක්‍ෂිත බෝධි ශාඛාව පැවති උස ප්‍රමාණය පිළිබඳ අදහස් ප්‍රකට කෙරෙන බව පෙනේ. ඒ දක්වා උසින් කළ රන් පිඨිකාවක් මත නැගී රජු විසින් ශාඛා කඳේ රත්සිරියෙලින් රේඛාවක් සටහන් කොට අධිෂ්ඨාන කළ සැනින් ඉහත දැක්වූ ආශ්චර්යයවත් සිදුවීම සිදුව තිබේ ( එම 41-43 ගාථා ).

වංසකථාගත විස්තර අනුව ශාඛාව කඳෙන් වෙන්වී කටාරම මස්තකයේ පිහිටිය ද එය රෝපණය නොවීම කැපී පෙනේ. ඉන් අනතුරු ව සිදුව ඇත්තේ ශාඛාව සිඳුණු ස්ථානයේ සිට අඟල් තුනෙන් තුනට නව ස්ථානයක රජු විසින් රත් සිරියෙලින් රේඛා සලකුණු කිරීමයි ( මහාවංශය 42-43 ගාථා). පෙර රේඛා කළ ස්ථානයෙන් මහත් මුල් ද පසු රේඛා කළ ස්ථානවලින් මුල් දහය බැගින් ද පැමිණීම සිදුව ඇත්තේ ආශ්චර්යාත්මක ස්වරූපයකිනි ( එම 44-45 ගාථා) . එකී මුල් පද්ධතිය දැලක් ආකාරයෙන් පහත ඇදුණු බව මහාවංසයේ විස්තර වේ. මුල් ඇදීමෙන් පසු ව කටාරමේ හා එහි බහා තිබූ සුවඳ මඩෙහි ගිලීයාම සිදුව තිබේ. ඉන් අනතුරු ව කටාරම සහිත බෝධි ශාඛාව සත් දිනක් පමණ හිමගර්භයක පිහිටිබව දක්වා ඇත (එම 54-55 ගාථා). ජිනකාලමාලියේ ද ඒ හා සමාන විස්තරයක් අන්තර්ගත නමුදු ඊට අනුව සත් දිනකින් හිමවලා ඉවත් ව ගිය පසු සම්පූර්ණ වූ කඳ, අතු, කොළ හා ගෙඩි සහිත ව දෘශ්‍යමාන ව ඇත ( ජිනකාලමාලී 146 ).

## මුල් අද්දවා ගැනීම හා ඒ හා බැඳි තාක්ෂණික ක්‍රියාවලිය

මහාවංසයේ මෙලෙස වෙන් කරගනු ලැබූ බෝධි ශාඛාවේ ස්වරූපය හා විශාලත්වය සැකෙවින් දක්වා තිබේ. එකී විස්තරයට අනුව රියන් දහයකින් (අඩි 15) පමණ උස් වූ ප්‍රධාන ශාඛා පහක් සහ ඒවායෙන් නික්මුණු කුඩා අතු දහසක් පැවතී තිබේ. ශාඛාවක් රියන් 4ක (අඩි 6) පමණ උසින් යුක්ත ව පිහිටියේ ය (මහාවංශය පරි.xviii 48-49 ගාථා). ඇතැම්විට මෙම අගයන් ද අතිශයෝක්තිගත විය හැකි නමුදු ඉහත දැක්වූ කටාරමේ විශාලත්වය හා සාපේක්ෂ වශයෙන් සැසඳෙන බව මෙහිලා පෙන්වාදිය යුතු ය. බෝධි ශාඛාව හා කටාරමේ විශාලත්වය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී පෙනීයන ප්‍රධාන කරුණක් නම්, මහාබෝධි ආගමනයේ දී හැකිතාක් විශාල ශාඛාවක් මෙරටට ගෙන ඒමට උත්සුක වූ බවයි. බෝධිසත්ත්වයන් සම්බුද්ධත්වයට පත්වන අවස්ථාවේ එහි වූ ශාඛාවක් හෝ එබඳු විශ්වාසයක් සහිත ශාඛාවක් ම ලබා ගැනීමේ අපේක්ෂාවක් ඇතැම් විට ඒ කෙරෙහි ඉවහල් වන්නට ඇත. යටත් පිරිසෙයින් ශ්‍රී මහාබෝධියේ දක්ෂිණ ශාඛාව ම වෙන් කර ගැනීම කෙරෙහි හේතු වූ කරුණු වංසකථාවල විස්තර වී නොමැත. 'දකුණු පස' පෙරදිග මිනිසුන්ගේ විශේෂ අගය කිරීමට ලක්වන බැවින් වංසකථාකරුවන් ප්‍රස්තුත ප්‍රවාදය නිර්මාණය කළා විය හැකි ය. එහෙත් උද්භිද විද්‍යාත්මක වශයෙන් ගත් කළ එක ම ශාකයක වුව ද ශාඛා කිහිපයක් වුව ද රෝපණය කිරීම, ඖෂධ සඳහා භාවිත කිරීම, දැව වශයෙන් භාවිත කිරීම හෝ එබඳු වෙන යම් උපයෝගීතාවන් සඳහා දක්වන යෝග්‍යතාව අසමාන විය හැකි ය. නවීන බව හෝ පැරණි බව යන සාධකය හැරුණු විට සූර්යාලෝකය ලැබීමේ ප්‍රමාණය, දිශානුගත පිහිටීම, ශාඛා හා පශාඛා ගණන, පත්‍ර සංඛ්‍යාව, උන්නතාංශය, මූල පද්ධතියට ඇති දුර ප්‍රමාණය මෙන් ම තවත් පාරිසරික තත්ත්වයන් ඒ කෙරෙහි ඉවහල්විය හැකි ය. එබැවින් ප්‍රස්තුත සිදුවීමට අදළ ව සැලකීමේ දී රෝපණයට සුදුසු ශාඛාවක් තෝරාගනු ලබන්නට ඇති බව උපකල්පනය කළ හැකි අතර එය දකුණු දෙසින් පිහිටා තිබෙන්නට ද ඉඩ ඇත.

'ෆිසියස් රෙලිජියෝසා' (*Ficus religiosa*)යන උද්භිද විද්‍යාත්මක නාමයෙන් හඳුන්වන 'ඇසතු' මෝරුස (Moraceae) කුලයට අයත් ශාකයකි ( මහාවංශය xviii, 48-49 ගාථා). එහෙත් අයදතනය වනවිට වැඩි වශයෙන් හඳුන්වනු ලබන්නේ 'බෝ' යන පර්යාය නාමයෙනි. ඉන්දියාව නිජබිම කරගත් බහු වාර්ෂික ශාකයක් වන මෙය අඩි 100ක් දක්වා සාමාන්‍ය උන්නතාංශයක් පෙන්නුම් කරයි ( tp:/en.m.Wikipedia.org/wiki/Ficus-riligiosa ). මෝරුස කුලයේ සෙසු ශාක මෙන් බෝ වෘක්ෂය ද ගෙඩි මගින් පරම්පරාව පවත්වාගෙන යන ශාකයක් වන නමුදු මුල් හා අතු මගින් ද රෝපණය කිරීමේ හැකියාව පවතීයි ( ibid ). කෙසේ නමුදු වංසකථාවවල දැක්වෙන අන්දමේ සැලකිය යුතු විශාලත්වයකින් යුක්ත ශාඛාවක් රෝපණය කර ගැනීමට ඇති ශක්‍යතාව පිළිබඳ විමර්ශනයේ දී, මහාවංසයේ කියවෙන තරමේ විශාලත්වයකින් යුත් බෝධි ශාඛාවක් වුව ද මුල් අද්දවා ගැනීමේ හැකියාව පවතින බව ඒ පිළිබඳ විද්‍යාත්මක දැනුම මෙන්ම ප්‍රයෝගික අත්දැකීම් සහිත පර්යේෂකයන්ගේ මතය වී ඇත ( විජේසුන්දර 2014. 6. 16).

මව් ශාකයෙන් බෝධිශාඛාව වෙන්වී ම ආශ්චර්යවත් සිදුවීමක් ලෙස වාර්තා කර ඇති බැවින්, අත්ත කඳට ආබද්ධව තිබිය දී හෝ කඳෙන් වෙන් වුණු පසු මුල් අද්දවා ගැනීම සිදුකළේ ද යන්න හඳුනාගැනීම දුෂ්කර වේ. කෙසේ නමුදු බෝධි රෝපණයට මත්තෙන් ශාඛාව මුල් අද්දවා ගැනීම සිදු කරන්නට ඇතිබව පෙනීයන්නේ රත්සිරියලෙන් කළ පළමු රේඛාව අසලින් මහත් වූ මුල් ද දෙවනු ව

රේඛා දමූ ස්ථාන නවයෙන් කුඩා මුල් ද පැන නැගිබව කියවෙන හෙයිනි. 'රත්සිරියෙල්' යනු පොළොවෙන් ලබාගන්නා ඛනිජ විශේෂයකි. ව්‍යවහාරයේ දී ගුරුගල් ලෙස හඳුන්වන මේවා වංශකථාවල ඇතැම් ස්ථානයන්හි සිතුවම්කරණය සඳහා භාවිත මාධ්‍යක් ලෙස දක්වා තිබේ ( මහාවංශය පරි. xxvii, 19 ගාථාව; xxix, 11-12 ගාථා). අද්‍යතනය වන විට ද මේවා වර්ණ නිෂ්පාදන කටයුතු සඳහා භාවිත කෙරේ. රත්සිරියල් ආයුර්වේදයේ දී මනෝසීල ලෙස හඳුන්වන අතර ( මහා සිංහල ශබ්ද කෝෂය 2005. 1315) පිළිකානාශක ඖෂධ නිෂ්පාදනය සඳහා භාවිත කෙරේ. ඇතැම්විට ශාකවල මුල් අද්දවාගැනීම වැනි කාර්යයක් සම්බන්ධයෙන් දක්වන විශේෂ ගුණයක් මෙකී භාවිතය සඳහා හේතුවන්නට ඇත. නැතහොත් වංසකථා රචනාවූ හෝ සංස්කරණයවූ යුගය වන විට යටත් පිරිසෙයින් යම් යම් දෑ සලකුණු කිරීමේ කාර්යය සඳහා ගුරුගල් භාවිත වූ බැවින් යථෝක්ත බෝධි ශාඛාව මත සලකුණු යෙදීමට ද එකී මාධ්‍යය භාවිත කළබව දක්වන්නට ඇත.

රත්සිරියලින් රේඛා දැමීම යන්නෙන් බොහෝවිට බෝධි ශාඛාව වෙන් කර ගැනීමට හා මුල් අද්දවාගැනීමට කැපුම් ලකුණු යෙදීම සංකේතවත් කෙරෙන බව උපකල්පනය කළ හැකි ය. මන්ද යත්, වංසකථාවන්ට අනුව ම බෝධි ශාඛාවේ මුල් ඇදීම සිදුවන්නේ එකී රත්සිරියලින් කළ රේඛාවන් මතිනි ( මහාවංශය පරි. xviii, 44-46 ගාථා බලන්න ). ශාකයක ස්ථාවරත්වය කෙරෙහි යහපත් මුල් පද්ධතියක් පැවතිය යුතු බව අප කවුරුත් දන්නා කරුණකි. එබැවින් අඟල් තුනෙන් තුනට කැපුම් ලකුණු යෙදීමෙන් ප්‍රධාන කැපුමෙන් හැරුණුකොට තවත් ස්ථානවලින් මුල් අද්දවාගැනීම අරමුණු කරන්නට ඇති බව සිතිය හැකි අතර ඒ ඔස්සේ ශාඛාව ස්ථාවර කරගැනීම අරමුණු කරන්නට ඇත. දැලක ආකාරයෙන් මුල් පහත බැසීම යන්නෙන් දැක්වෙන්නේ ශාඛා කඳේ එක් එක් ස්ථානවලින් සැලකිය යුතු මුල්ඇදීමක් පෙන්නුම් කළ බව විය යුතු ය.

වංසකථාගත තොරතුරු අනුව ශාඛාව මුල් අද්දවාගැනීම සඳහා හිතකර රෝපණ මාධ්‍යයන් ද භාවිත කර ඇති බව සිතීමට ඉඩ තිබේ. ඒ බව පෙනීයන්නේ බෝධි රෝපණය සිදු කළ කටාරම 'සුවඳ කලල්වලින්' පුරවා තිබූ බව දක්වෙන හෙයිනි ( එම පරි. xviii, 47 ගාථාව බලන්න ). 'කලල් ' යන පාලි පදයෙ සිංහල අර්ථය 'මඩ' යනුවෙනි ( Karunatilake 2012, 63 ). බෝහෝවිට බෝධි ශාඛාව සුගන්ධවත් මඩෙහි රෝපණය කිරීම යන්නෙන් ඊට ගෞරවාර්ථයක් එක් කිරීම අපේක්‍ෂා කරන්නට ඇතත් ඇතම්විට එයින් විවිධ ද්‍රව්‍ය එක් කර විශේෂිත රෝපණ මධ්‍යයක් බවට පත් කර පැවති බව ප්‍රකාශ වීමට ඉඩ තිබේ. ව්‍යවහාරයේ දී 'පස්' හා 'මඩ' යනු එකිනෙකට වෙනස් ද්‍රව්‍ය ද්විත්වයකි. එකී වෙනස කෙරෙහි ප්‍රධාන හේතුව වී ඇත්තේ පස් හා සාපේක්‍ෂව මඩවල ජලය වැඩි ප්‍රමාණයක් අන්තර්ගත වන බැවිනි. බොහෝවිට මඩ යන්නෙන් වංශකථාකරු අදහස් කරන්නට ඇත්තේ බෝධි රෝපණය කළ කටාරමේ ජල සාන්ද්‍රණය වැඩි පස් බහා තිබූ බවකි. යම් ශාඛාවක් මුල් අද්දවාගැනීම සඳහා ඊට යොදන රෝපණ මාධ්‍යයේ අවශ්‍ය තරම් ජලය පැවතීම පමණක් ප්‍රමාණවත් නොවේ. වර්තමානයේ දී වුව ද ශාඛාවක් මුල් අද්දවා ගැනීමට පමණක් නොව, පැලයක් වුව රෝපණයේ දී ඒ සඳහා කාබනික ද්‍රව්‍ය වැඩි පසක් භාවිත කරයි. භූ විද්‍යාත්මක ස්තරායනය අනුව ගත් කළ පොළොව මතුපිට වන පස් තට්ටුව කාබනික ද්‍රව්‍ය එක්වීම නිසා ශාක රෝපණය වීමට අවශ්‍ය පෝෂණ ගුණයෙන් යුක්ත වෙයි. එය හඳුන්වනු ලබන්නේ හියුමස් පස යනුවෙනි. එහෙයින් මේ අවස්ථාවේදී ද යටත් පිරිසෙයින් ජලය ද සම්මිශ්‍රිත හියුමස් පස හෝ බෝධි ශාඛාව මුල් අද්දවා ගැනීම සඳහා භාවිත කරන්නට ඇති බව උපකල්පනය කළ හැකි වේ.

බෝධි ශාඛාව කටාරමේ ස්ථාපිත වීමෙන් පසු සිදුවීම් පිළිබඳ වංසකථාවල අන්තර්ගත විස්තරය අතිශයෝක්තිගත වර්ණනාවක් ලෙස පෙනුණ ද ඊට යම් උද්භිද විද්‍යාත්මක කාරණයක් පදනම් ව ඇති බව පෙනේ. එනම් මහාවංසයට අනුව 'හිමගර්භයෙක්හි පිහිටි'( මහාවංශය පරි. xviii, 55 ගාථාව බලන්න) හා ජිනකාලමාලිය මෙන් ම මහාබෝධි වංසයට අනුව 'හිමවලාවලින් වැසී පැවතීම'( ජිනකාලමාලී 146 පිට බලන්න ) යන්නෙන් බෝධිය කටාරමේ රෝපණය කිරීමෙන් පසු විශේෂ පරිසර තත්ත්වයක් යටතට පත්කිරීම යන කරුණ ප්‍රකට වෙන බැවිනි. උණුවතුරබුබුලේ මහින්ද හිමියන් මේ පිළිබඳව දක්වන අදහස නම්, නොබෝ දිනකින් බෝධි ශාඛාව ලංකාවට වැඩම කරවීමට නියමිත බැවින් එය තවදුරටත් ස්ථාවර කිරීමේ අරමුණින් ආරක්‍ෂා සහිත ව පවත්වා ගැනීම මෙයින් කියවෙන බවයි (මහින්ද හිමි 2002, 227). එහි ද සත්‍යතාවක් පැවතිය හැකි නමුදු උන්වහන්සේ මෙහි කියවෙන විශේෂ පරිසර තත්ත්වය පිළිබඳ අවධානයක් දක්වා ඇති බවක් නොපෙනේ. හිමගර්භයක, හිමවලාවලින් වැසී පැවතීම යන්නෙන් බොහෝවිට උෂ්ණත්වය, ආර්ද්‍රතාව, සුළඟ වැනි විවිධ පාරිසරික තත්ත්වයන් පාලනය කළ හැකි කෘතිම ව නිර්මාණය කළ පරිසරයක් සංකේතවත් විය හැකි බව අපගේ අදහස වේ.

මහාවංසයට අනුව බෝධි ශාඛාව හිමවලා ගැබක සැඟ ව ගිය පසු ඊට තුෂාර ජලයෙන් යුක්ත වූ මේඝයෝ ද එකතු වූ රශ්මීහු ද නැවත ලැබෙන්නේ සත් දිනක් නික්මයාමෙන් අනතුරුව ය ( මහාවංශය පරි. xviii, 56 - 57 ගාථා බලන්න). එකී කරුණ වංසත්ථප්පකාසිනීයේ වුව ද සවිස්තර ව නොමැති නමුදු ස්වාභාවික පරිසර සාධකයන්ගෙන් වියුක්ත කර තැබීමක් අදහස් කෙරෙන බව පෙන්නුම් කෙරේ. ඇතැම්විට මහාවංසයේ කියවෙන හිම ගර්භය නූතනයේ හඳුන්වන හරිතාගාර පරිසර තත්ත්වයකට සමාන වීමට ඉඩ තිබේ. බෝධි ශාඛාවක් මුල් අද්දවා ගැනීම සඳහා පාලනය කරන ලද පරිසර සාධක සහිත ස්ථානයක් වඩාත් යෝග්‍ය වූ බව නිසැක ය. තව ද, එලෙස විශේෂ පාරිසරික තත්ත්වයක් යටතේ පවත්වාගත් කාල අවකාශය ප්‍රස්තුත මූලාශ්‍රයවල සතියක් ලෙස දක්වා ඇත. එහෙයින් මේ හැරුණුකොට ආශ්චර්යවත් සිදුවීම් මාලාවක් නිසා බොහෝ පිරිසකගේ අඛණ්ඩ වන්දනාමානයට ලක්වෙමින් තිබූ බෝධි ශාඛාව, වංසකථාවල කියවෙන පරිදි තවත් එබඳු ම ආශ්චර්යයකින් මිනිසුන්ගෙන් වියුක්ත ව පැවතීමට හේතු හඳුනාගැනීම දුෂ්කර ය. ජිනකාලමාලීයට අනුව සත් දිනකින් හිම වලා ඉවත් ව ගිය විට බෝධි ශාඛාව කඳ, අතු, කොළ හා ගෙඩි සහිත ව දෘශ්‍යමාන වූ බව කියවීමෙන්, යටත් පිරිසෙයින් මෙම කාල අවකාශය තුළ මුල් පද්ධතිය ස්ථාපිත වීම හෝ අදහස් කෙරෙන බව උපකල්පනය කළ හැකි ය.

එහෙත් මූලාශ්‍රයවල දැක්වෙන අන්දමේ විශාලත්වයකින් යුත් බෝධි ශාඛාවක් සාර්ථක ලෙස ස්ථාපිත කරගැනීම සඳහා සතියක පමණ කාලයක් ප්‍රමාණවත් වේද යන්න ගැටලුකි. නූතන තාක්‍ෂණය භාවිතයෙන් වුව යථෝක්ත කාර්යය සිදු කිරීම සඳහා අවම වශයේ මාස 2ක් හෝ 2 1/2ක කාලයක් ගත වේ (විජේසුන්දර 2014.6.16). කෙසේ නමුදු මහා බෝධි අගමනය හා සංඝමිත්තා ආගමනයෙන් මෙරටින් ගිය දූත පිරිස ඉන්දියාවේ ගත කළ කාලය මාස 2 1/2කට ආසන්න බව පෙනේ. මහාවංසයට අනුව අරිට්ඨ ඇතුළු දූත පිරිස වප් මස පුර පක්‍ෂයේ දෙවන දින මෙරටින් ඉන්දියාව බලා ගමන් ආරම්භ කර ඇති අතර එදින ම ඔවුහුපැළලුප් නුවර වෙත ළඟා වූහ ( මහාවංශය පරි. xviii, 7 ගාථාව). එක් දිනකින් උතුරු ඉන්දියාවට ළඟාවීම කෙසේ වත නමුදු එකී දිනය වෙන විට හෝ මහාබෝධිය වැඩම කරවීමට අවශ්‍ය කටයුතු ආරම්භ වන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය. ජිනකාලමාලීයේ අන්තර්ගත කරුණක් අනුව බෝධි ශාඛාව මැනවින් ස්ථාපිත වන තුරු මෙරටට

ගෙන ඒමට කටයුතු සංවිධානය නොවූ බවක් පෙන්නුම් කෙරෙන්නේ බෝධිය කටාරමේ රෝපණය කිරීමෙන් දින 31 ක් පුරාවට භාරතයෙහි ම නොයෙක් වන්දනාමාන සිදුකළ බව කියවෙන හෙයිනි. එකී කාල පරිච්ඡේදය අවසානයේ බෝධි ශාඛාවේ නව දලු දැමීම සිදුව තිබේ ( ජිනකාලමාලී 146 පිට). සැබවින් ම නව දලු දැමීම යනු එහි මූල පද්ධතිය මැනවින් ස්ථාපිත වූ බව තහවුරු කෙරෙන සංඥාවකි. කෙසේ නමුදු මහාවංසයට අනුව නොයෙක් පුදපූජා හා දීර්ඝ උත්සව මාලාවකට පසු උඳුවප් මස පුර පක්ෂයෙහි පැළවිය දින මහාබෝධිය හා සංඝමිත්තා තෙරණින් වහන්සේ පෙරටු කරගත් දූත පිරිස මෙරට බලාපැමිණීමට භාරතයෙන් නැව් නැග තිබේ.

## මහාබෝධි රෝපණය

සත් දිනකින් පමණ ඔවුන් මෙරටට ළඟාවුණු අතර ඒවන විට ද මෙරට ශ්‍රී මහාබොධි රෝපණය සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය වී පැවති බවට මූලාශ්‍රය සාක්ෂි දරයි. පෙර බුදුවරුන්ගේ ද බෝධීන් වහන්සේලා රෝපණය කරන ලද ස්ථානය වශයෙන් හඳුනාගත් ස්ථානයක් ම ගෞතම මුනිඳුන්ගේ ජය බෝධිය රෝපණයට ද තෝරාගැනීමෙන් පෙනී යන්නේ ඊට පෙර සිට ම එම ස්ථානයෙහි විශේෂ සූදනමක් පැවති බවකි. වර්තමාන වන විට ශ්‍රී මහා බෝධිය පිහිටි මළුවේ උස සම්බන්ධයෙන් සැලකීමේ දී පිහිටි පොළොව මට්ටමේ සිට ආසන්න වශයෙන් අඩි 21ක් පමණ උන්නතාංශයකින් පිහිටා ඇතිබව හඳුනාගත හැකි අතර( Seneviratna 1994, 88) එය පසුකාලීන වශයෙන් සිදුවුණු පස් පිරවීම් හේතුවෙන් ම නිර්මාණය වුණු නිර්මිත පරිසර තත්වයක් බව සිතීම දුෂ්කර වේ. එබැවින් ශ්‍රී මහාබෝධිය මුල් වරට රෝපණය කරන විට ම ඒ සඳහා පොළොව මට්ටමෙන් ඉහළ තලයක් නිර්මාණය කර තිබූ බව පෙනේ. ඉකුත් සියවසේ මෙම ස්ථානය ආශ්‍රිත ව සිදුවුණු පුරාවිද්‍යාත්මක පර්යේෂණයන්ගෙන් බෝධිය උදෙසා ගොඩනගා තිබූ බෝධි ප්‍රාකාරයක කොටසක් හා සලපතළ මළුවකට අයත් ශිලා පුවරු හඳුනාගැනීමට හැකිව තිබේ. එකී බෝධි ප්‍රාකාර කොටස ක්‍රි. පූ. 3වන සියවසේ සිට ක්‍රි.ව. මුල්සියවස් කිහිපය පුරා ජනප්‍රිය ව පැවති බෞද්ධ ගල් ගරාදි වැටේ ආකෘතිය ආශ්‍රයෙන් නිර්මාණය වූවකි. මහාවංසයට අනුව තිස්ස රජු මුල් වරට මහාබෝධියට බෝධිඝරයක් කරවා ඇති අතර ධාතුසේන, මේඝවන්න, මහානාග, දෙවන අග්‍රබෝධි, දප්පුල යන රජවරුන් විසින් ඊට නව අංග එකතු කිරීම හා ප්‍රතිසංස්කරණ කටයුතු කර තිබේ ( See, *ibid* 86). උක්ත බෝධි ප්‍රකාර කොටසට වුව ද අඩි 10ක් පමණ උසිකින් ශ්‍රී මහා බෝධිය පිහිටා ඇති බැවින් දිවයිනේ සෙසු බෝධිඝරයන් හා සාපේක්ෂව සැලකීමේ දී මෙහි නිර්මිත පරිසරය විශේෂ ආරකට සකස්වී තිබූ බව පෙනේ. කෙසේ නමුදු බෝධිය පිහිටි සීමිත අවකාශය පසු කාලීන ව වරින් වර සිදුවුණු පස් පිරවීම නිසා යටත් පිරිසෙයින් අඩි කිහිපයක් හෝ උස් වූ බව උපකල්පනය කළ හැකි ය.

මූලාශ්‍රය අනුව මෙරට බෝධි රෝපණය සිදුවෙන අවස්ථාවේ දී ද අශ්චර්යමත් සිදුවීම් පෙළක් සිදු ව තිබේ. මහාවංසයේ කියවෙන පරිදි, මුල් කටාරම් මුව විටෙන් උඩ නැගී ඒ රන් බඳුන වෙළා ගනිමින් පොළෝ තලයට බැස ගැනීම ඉන් ප්‍රධාන එකකි. අතිශයෝක්තිගත වර්ණනය බැහැර කරගත් විට බෝධි ශාඛාව කටාරම ද සහිත ව රෝපණය කිරීමක් ඉන් ප්‍රකට කෙරෙන බව පෙනේ. තව ද, තොමෝ ම පොළොවේ බැස ගැනීම කෙසේ වෙතත් වංසකථා වාර්තා කරන පරිදි බෝධි රෝපණය සිදුවුණු බව කියවෙන 'වරුණ නැකත' සුබ කටයුතු ආරම්භ කිරීමට යෝග්‍ය වූ නැකතක් බව ජ්‍යෝතිෂයේ දැක්වේ. කටාරම සහිත ව බෝධි රෝපණය සිදුවී නම්, එමගින් අපේක්ෂා කළ කරුණ

පැහැදිලි නැතත් මුල් ඇද තිබූ බෝධි ශාඛාව ඉන් ඉවතට ගැනීමට පැවති ප්‍රායෝගික දුෂ්කරතාව ඒ කෙරෙහි හේතුවන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය. මූලාශ්‍රයවල කටාරම රනින් කරවූ බවට වන විස්තරය බොහෝ දුරට අභව්‍ය සිද්ධියක් ලෙස සැලකිය හැකි නමුදු යටත් පිරිසෙයින් කුමන මාධ්‍යයකින් කළ බඳුනකින් වුව ද එමගින් බෝධි ශාඛාවේ මූල පද්ධතිය වර්ධනයට සැලකිව යුතු ප්‍රතිරෝදයක් එල්ලවීම අපේක්‍ෂා කළ හැකි තත්ත්වයකි.

ශ්‍රී මහා බෝධිය පිළිබඳ අද්‍යතන නිරීක්‍ෂණයන්ට අනුව වුව ද එහි කඳ, අතු, කොළ ආදිය සෙසු බෝධි වෘක්‍ෂයන් සමග සංසන්දනය කිරීමේ දී කුඩා වූ ස්වරූපයක් පෙන්නුම් කරයි. සිරිල් විජේසුන්දර මහතා පෙන්වාදෙන කරුණු නිවැරදි නම්, මහා බෝධියේ මූල පද්ධතිය ආශ්‍රය කොටගෙන නිර්මාණය වී ඇති බව උපකල්පිත උඩ මළුවේ ඒ අසලින් ම වන බෝධි වෘක්ෂයන් වුව ද උක්ත ලක්ෂණය දක්නට නොලැබේ (විජේසුන්දර 2014.6.16). එබැවින් ඉහත දැක්වූ පරිදි යටත් පිරිසෙයින් සැලකිය යුතු කාලයක් හෝ ඇතැම්විට නූතනය දක්වා ම වුව ද බෝධියේ මූල පද්ධතිය වර්ධනයට පැවති හෝ පවතින බාධාවක් එහි වර්ධනය අඩාල වීමට ඉවහල් වූ බව සිතීමට ඉඩ තිබේ. එහෙත් 80 දශකයේ දී සිදු වූ බෝධි සංරක්‍ෂණ කටයුත්තක දී අඩි කිහිපයක් දක්වා බෝධිය සමීපයේ වූ පස් ඉවත් කිරීමට සිදුව ඇති අතර එහි දී එබඳු කටාරමක් හෝ එවැන්නකට අයිති යමක් හමු වූ බව වාර්තා නොවේ. එයින් මෙහිලා එවැන්නක් නොතිබෙන බවක් අදහස් නොකෙරෙන අතර තවදුරටත් පොළොව අභ්‍යන්තරයට ගමන් කිරීමේ දී එවැන්නක් හමුවීමට වුව ඉඩ තිබේ. තව ද, අප විසින් මෙහිලා සිහිකැඳවිය යුතු කරුණක් නම් මහාබෝධිය සැලකිය යුතු ආයාසයක් දරා බෝධි ශාඛාවකින් රෝපණය කරගත් වෘක්ෂයක් වන බවයි. එවැන්නකින්, බීජයක් මගින් රෝපණය වී ක්‍රමික ව වර්ධනය වුණු වෘක්ෂයක වර්ධනයට සමාන වර්ධනයක් අපේක්‍ෂා කළ නොහැකි ය.

බෝධි ශඛාව කටාර සහිත ව හෝ රහිත ව රෝපණය කිරීම කෙසේවෙතත් භාරතයේ දී බෝධි ශාඛාව කටාරමේ පිහිටි පසු සත් දිනක් හිමවලා ගැබක සැඟව පැවතියාක් මෙන් මහමෙවුනා උයනේ රෝපණය කිරීමෙන් පසු ව ද ඒ හා සමාන ම ආශ්චර්යවත් සිදුවීමක් සිදු ව තිබේ. එනම් සතියක පමණ කාලයක් මිනිසුන්ට නොපෙනී හිමවලා ගැබක සැඟ ව ගොස් යළි ප්‍රාදුර්භූත වීමයි ( මහාවංශය පරි. xix, 55 ගාථාව). මෙම විස්තරය සෙසු මූලාශ්‍රයවල දක්නට නොලැබේ. බෝධි ශාඛාව රෝපණය කිරීමෙන් පසු මෙරට පරිසරයට අනුවර්තනය වීම හා ස්ථාවරවීම විෂයයෙහි පෙර පරිදි ම මිනිසුන්ගෙන් වියුක්ත කර විශේෂ පරිසර තත්ත්වයක් යටතේ පවත්වා ගැනීමක් එයින් අපේක්‍ෂා කෙරෙන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය. සතියක කාලයක් ඉක්ම ගිය පසු බෝධිය මනා සෞඛ්‍ය සම්පන්න ව වැඩහුන් බව දැක්වීමෙන් එය මෙරට දේශගුණයට සැලකිය යුතු අන්දමින් අනුගත වූ බවක් අදහස් කරන බව පෙනේ. බොහෝවිට මහාබෝධිය හා බැඳි බෝධිරාජ තනතුර සතු වූ වගකීම් සම්බන්ධයෙන් කල්පනා කිරීමේ දී ශාකය පිළිබඳ විශේෂ උද්භිද විද්‍යාත්මක දැනුමක් ද එකී තනතුර දරූ පුද්ගලයා සතුවන්නට ඇති බව අනුමාන කළ හැකි ය. එසේ වී නම් ඔහු විසින් බෝධි රෝපණය හා ඉන්පසු සිදු වූ යථෝක්ත සිදුවීම් දමය සංවිධානය කරන්නට ඇති බව සිතිය හැකි ය.

## අෂ්ටඵලරුහ හා දෙතිස්පලරුහ බෝධීන් නිෂ්පාදනය

මහාබෝධියේ නැගෙනහිර දෙසින් වැටුණු විලිකුම් බෝ ඵලයක් මිහිඳු හිමියන් විසින් ගන්නා ලඳුව දේවනාම්පියතිස්ස රජුට දී හෙතෙම එය රෝපණය කිරීමෙන් පැනනැගි බෝධි අංකුර අට අෂ්ටඵලරුහ බෝධීන් වශයෙන් හඳුන්වනු ලැබේ. මෙහි කියවෙන පරිදි අලුත රෝපණය කරන ලද

වෘක්ෂයකින් වූ ද ඵලයක් ලැබීම භව්‍යතාවෙන් යුත් කරුණක් වන්නේ ශ්‍රී මහාබෝධිය සැලකිය යුතු විශාලත්වයෙන් යුත් බෝධි ශාඛාවක් වූ බැවිනි. තව ද ජිනකාලමාලීයට අනුව බෝධි ශාඛාව කටාරමේ රෝපණය කරන අවස්ථාවේ දී පවා එහි බෝ ඵල පැවත තිබේ (ජිනකාලමාලී 146 පිට). මේ සම්බන්ධ ව මහාවංසයේ එන විස්තරය වංසත්ථප්පකාසිනියේ වඩාත් සවිස්තර ව දක්වා ඇති අතර ඊට අනුව මිහිඳු හිමියන් විසින් ගනු ලැබූ ඵලය පලිබෝධ රහිත මනා ව පැසුණු එකකි ( වංසත්ථප්පකාසිනී 317 පිට බලන්න). ඒ අනුව රෝපණය සඳහා උචිත ඵලය විශේෂී කාරණයකින් යුතුව හඳුනාගෙන ඇති බව පෙනේ. මහාවංසයට අනුව මිහිඳු හිමියන් විසින් ලබාදුන් බෝ ඵලය රජු විසින් සුවඳ පසින් පිරි කටාරමක රෝපණය කර ඇති අතර එකෙනෙහි ම එයින් බෝධි අංකුර 8ක් හටගෙන ඒවා රියන් 4ක් දක්වා ඉහළ නැග තිබේ ( මහාවංශය පරි. xix, 58 ගාථාව). එකෙණෙහි ම බෝධි අංකුර පැන නැගුණු බව කියවෙන ආශ්චර්යවත් සිදුවීම කෙසේවන නමුදු බෝධි ශාඛාව රෝපණය කර ගැනීමට භාවිත කළ ආකාරයෙන් ම සුවඳ පසින් පිරුණු කටාරමක් යොදගැනීමෙන් පෙනීයන්නේ බෝ ඵලය රෝපණය කර ගැනීම සඳහා විශේෂ පෝෂණ මාධ්‍යයක් භාවිත කරන්නට ඇති බවයි.

වංසකථාවල දක්වෙන පරිදි බෝ ඵලයකින් රියන් හතරක් (අඩි 6) පමණ උසැති බෝ පැලයක් රෝපණය කර ගැනීම සඳහා සැලකිය යුතු කාල අවකාශයක් ගත වෙයි(විජේසුන්දර 2014.6.16). එහෙයින් දිවයිනේ සෙසු ස්ථානවල රෝපණය කිරීමට අපේක්ෂිත මහාබෝධියේ බෝ පැල එක් ස්ථානයක සංවිධානාත්මක ව රෝපණය කර බෙද හැරීම සිදු කරන්නට ඇති බව උපකල්පනය කළ හැකි අතර එය වඩාත් තහවුරු වන්නේ මහා බෝධියෙන් ලබාගත් තවත් බෝ ඵල සතරකින් බෝ පැල 8ක් බැගින් බෝ පැල 32ක් පමණ නිෂ්පාදනය කරගත් බව කියවෙන හෙයිනි. ඒවා දෙතිස්ඵල රුහ බෝධීන් වශයෙන් හැඳින්වේ. මහාවංසයට අනුව දඹකොළ පටුන, තිවක්ක බ්‍රාහ්මණග්‍රාම, ථූපාරාමය, ඉසුරුමුණිය, ප්‍රාථමික චෛත්‍යස්ථානය, සෑගිරිය, කතරගම හා සඳුන්ගම යන ස්ථාන අෂ්ටඵල රුහ බෝධීන් රෝපණය කරන ලද ස්ථාන වේ (මහාවංශය පරි. xix, 60 - 61 ගාථා). දෙතිස්ඵල රුහ බෝධීන් ස්ථාපිත ස්ථාන මහාවංසයේ සඳහන් ව නැතත් මහා බෝධිවංසයේ එකී ස්ථාන නම් කර තිබේ. ඒවානම් මල් වැස්ස වෙහෙර, තන්ත්‍රිමාලා වෙහෙර, මහ ජල්ලික නම් කෙවුල්ගම, කොට්ටියාරම, පොළොන්නැව, මාතලේ රුයිගම, මාගම, විල්වල, මහියංගනය, විල්ගම් වෙහෙර, මුතියංගනය, බුත්තල හප්පෝරු වෙහෙර, සිතුල්පව්ව, තංගල්ල වනවාස වෙහෙර, වැලිගම් වෙහෙර, පරගොඩ, මැද්දේගම, ගණේගම, කොත්මලේ පුසුල් පිටිය, වතුර, බෙලිගල, බෙල්ලන්විල, වඳුරව, වට්ටාරම, සුලුගල්ලේ, රුස්රේව, කටියාව, යාපව සුන්දරගිරි පවුව, කසාගල වෙහෙර, අඹලව රහත්ගල් වෙහෙර යනුයි. එහෙත් මේ අතර එන ඇතැම් ස්ථාන පුරාතන යුගයට වඩා මධ්‍යතන අවධිය වන විට ජනප්‍රිය ස්ථාන වූ බැවින් ප්‍රස්තුත කෘතිය ලියවුණු හෝ සංස්කරණය වුණු අවදිය වන විට ජනප්‍රිය ව පැවති ආගමික ස්ථාන, මෙලෙස දෙතිස්ඵලරුහ බෝධීන් ස්ථාපිත ස්ථාන ලෙස නම් කරන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය. කෙසේ නමුදු මහා බෝධියෙන් ලබාගත් බෝ ඵලවලින් රෝපිත වෘක්ෂ සංඛ්‍යාව සමසතලිස් බෝධීන් වහන්සේලාට පමණක් සීමා වූ බව නොපෙනේ. මහාවංසයට අනුව ම දිවයිනේ හාත් පස යොදුනෙන් යොදුන පිහිටි විහාරස්ථානවල බෝධින් වහන්සේලා රෝපණය කිරීම සිදු කර තිබේ. එලෙස දිවයින පුරා විවිධ පරිසර කලාපවල රෝපණය කළ බෝධි වෘක්‍ෂ ද සංවිධානාත්මක ව නිෂ්පාදනය කරන්නට ඇති අතර ඊට විශේෂඥ දැනුමක් සහිත පිරිසක් ද ඒ සඳහා සහභාගීවන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය.

**සාකච්ඡාව**

ඉහත දීර්ඝ ලෙස සාකච්ඡා කළ පරිදි ශ්‍රී මහාබෝධි ශාඛාව වෙන් කර ගැනීම, මුල් අද්දවාගැනීම හා රෝපණය සම්බන්ධයෙන් වන වංසකථාගත විස්තර බෙහෝ අතිශයෝක්තිගත මෙන් ම අශ්චර්යාත්මක සිදුවීම් රැසකින් සමන්විත වුව ද ඒ යටින් දිවෙන තාක්‍ෂණික ක්‍රියාවලිය භව්‍යතාවෙන් යුක්ත ය. ආගමික සංස්කෘතික අභිලාෂයන් අරමුණු කොටගෙන රචනා වූ යථෝක්ත සාහිත්‍ය මූලාශ්‍රය මගින් යටත් පිරිසෙයින් යම් සිදුවීමක් සම්බන්ධ සියලු ආයතනිකමය හෝ තාක්‍ෂණික ක්‍රියාවලිය විස්තර වේ ය යන්න අපේක්‍ෂා කළ නොහැකි ය. එමෙන් ම හුදීජන පහන් සංවේගය උදෙසා කළ මහාවංසය වැනි කෘතියක් තුළ එහි මුඛ්‍යාර්ථය මුදුන් පමුණුවා ගැනීම සඳහා උත්සාහ දැරීමේ දී අතිසංවේදී ආගමික සිදුවීම් ආශ්චර්යවත් සිදුවීම් ලෙස වර්ණනා කිරීමෙන් තොර විකල්පයක් හඳුනාගත නොහැකි වූ බව පෙනේ. මෙහි ඇතැම් තැනෙක උද්භිද විද්‍යාත්මක කරුණු ආශ්චර්යවත් සිදුවීම් ලෙස විග්‍රහ කිරීමට යාමේ දී වංසකථාකරුවන් ගැටලුවලට මුහුණ පෑ අවස්ථා ද දක්නට ලැබේ. මහබෝධිශාඛාව ප්‍රතිහාර්යයකින් තොමෝ ම සිඳී වෙන්වූ බව කියූව ද ඊට පෙර හා පසු පැවති තාක්‍ෂණික ක්‍රියාවලිය සඳහන් නොකර සිටීමට ඔවුන්ට නොහැකිව ඇත. එමෙන් ම විශේෂ සිදුවීම්, එක් එක් මාසවලට අදාළ විශේෂ දිනවලට සම්බන්ධ කිරීමට යාම නිසා ද ප්‍රස්තුත බෝධි රෝපණ ක්‍රියාවලියට ගතවුණු කාල අවකාශය පිළිබඳ නිශ්චිත අදහසකට එළඹීම සම්බන්ධයෙන් ගැටලු ඇති කරවයි. සමස්තයක් ලෙස ගත් කළ වංසකථාගත ප්‍රවාදවලින් ප්‍රකට කෙරෙන බෝධි රෝපණය හා බැඳි තාක්‍ෂණික ක්‍රියාවලිය වඩාත් විධිමත් මෙන් ම සංවිධිත වූවකි. ඉන්දියාවෙන් පැමිණි ධර්මදූත පිරිස සිය කාර්ය සාඵල්‍යය සාර්ථක කරගැනීම සඳහා සංකේතයක් මෙන් ම මෙවලමක් ලෙස මහාබෝධිය යොදගැනීමට සැලසුම් කිරීම ඒ කෙරෙහි ඉවහල් වන්නට ඇත. එමෙන් ප්‍රතිලෝම වශයෙන් මහාබෝධිය රෝපණය ආශ්‍රිත තාක්‍ෂණික ක්‍රියාවලිය සාර්ථක කරගැනීම, මහා බෝධි සංස්කෘතිය මුල් බැසගැනීම කෙරෙහි ඉවහල් වූ බව පැහැදිලි ය. මහා බෝධියට පසු අෂ්ටඵලරුහ බෝධීන් ද, දෙතිස්ඵලරුහ බෝධීන් ද මුල් බැස ගැනීම හා සමගාමී ව බෝධි සංස්කෘතිය ස්ථාපිත වීම හා දිවයින පුරා ව්‍යාප්ත වීම සිදුවිය. එහෙයින් එකිනෙකට සම්බන්ධ මහාබෝධි සංස්කෘතිය මුල් බැසගැනීම මෙන් ම භෞතික වශයෙන් සිදු වූ බෝධීන් මුල් බැසගැනීම ශ්‍රී ලාංකේය ඉතිහාසයේ සුවිශේෂී සන්ධිස්ථානයක් ලෙස සැලකිය හැකි ය.

**විශේෂ ස්තුතිය**

ශ්‍රී ලංකා උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂජනරාල් ආචාර්ය සිරිල් විජේසුන්දර මහතාට අපගේ කෘතඥතාවය පිරිනැමේ

**මූලාශ්‍රය**

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

**ජිනකාලමාලී**, සංස්. පී. බුද්ධදත්ත හිමි, ශ්‍රී ලංකා බෞද්ධ මණ්ඩලයඃ කොළඹ, 1956.

**බෝධිවංශය**, සංස්. සේනාධීර, ගුණපාලඃ ගල්කිස්සඃ අභය ප්‍රකාශකයෝ, 1970.

**මහාවංශය** (සිංහල), සංස්. හික්කඩුවේ සුමංගල හිමි සහ බටුවන්තුඩාවේ දේවරක්ෂිත, කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2006.

**මහා සිංහල ශබ්ද කෝෂය**, සම්ඃ විජේතුංග, හරිශ්චන්ද්‍රඃ කොළඹ එම්.ඩී. ගුණසේන සහ සමාගම, 2005.

**වංසත්ථප්පකාසිනී** (මහාවංශ ටීකාව), සංස්. ඒ. අමරවංශ හිමි සහ හේමචන්ද්‍ර දිසානායක, පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයඃ කැලණිය, 1994.

**සමන්තපාසාදිකා විනයට්ඨ කථා** (සංහල පරිවර්තනය), සම්ඃ ඒ. ධම්මකුසල හිමි, රාජකීය ආසියාතික සංගමය, ප්‍රකාශනය කළ ස්ථානය සඳහන් නොවේ, 2003.

**සිංහල ථූපවංශය**, සංස්. ඩබ්. එස්. කරුණාතිලක, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 2013.

මහින්ද හිමි, උණුවතුරබුබුලේ 2002, ශ්‍රී මහා බෝධි පුරාණය, **සම්මුති** (ශාස්ත්‍රීය සංග්‍රහය), සංස්. තලංගම සෝමසිරි හිමි; උණුවතුරබුබුලේ මහින්ද හිමි සහ තවත් අය, ගම්පහඃ කර්තෘ ප්‍රකාශන

**සිරිලක ගස්කොළන් අත්පොත**, 2004, ඇෂ්ටන්, මාක්; නීල් ද සිල්වා සහ තවත් අයඃ කොළඹ, ශ්‍රී ලංකා වන ජීව උරුම භාරය,

*A Sanskit English Dictionary* , Williams, M. : Oxford , The Charendon Press, 1986

Karunatilake, W.S. 2012, *Etymological Lexicon of The Sinhala Language, vol I*, Colombo : S. Godage & brothers (Pvt) LTD

Seneviratna, A. 1994, *Ancient Anuradapura*: Colombo, Archaeological Survey Department

**සම්මුඛ සාකච්ඡා**

2014.06.16 - වන දින ශ්‍රී ලංකා උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී මහාබෝධියේ උද්භිද විද්‍යාත්මක පාර්ශ්වය සම්බන්ධයෙන් නිල වගකීම් දරන, බෝධි සංරක්ෂණය පිළිබඳ පුළුල් අත්දැකීම් ඇති ආචාර්ය සිරිල් විජේසුන්දර මහතා

**අන්තර්ජාලය**

tp:/en.m.Wikipedia.org/wiki/Ficus-riligiosa (2014.07.05)